**ද්විතියික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය (ණය අංක 2276-එස්ආර්අයි) - 2012**

---

**1. මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර , මාගේ මතය වනුයේ

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මූල්‍ය කාර්ය සාධනය

------------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව , 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.605,860,773 ක් වූ අතර, 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.9,930,822,965 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 372,819,470 | 801,451,254 | 5,792,069,684 |
| උපකරණ හා ද්‍රව්‍ය | 146,935,500 | 331,997,152 | 3,739,716,684 |
| පොලී ගාස්තු | 86,105,803 | 49,519,724 | 399,036,597 |
| එකතුව | 605,860,773 | 1,182,968,130 | 9,930,822,965 |

### 2.2 අග්‍රිම අරමුදල් ගිණුම

----------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් හා එදිනට එම ගිණුමේ පැවති ශේෂය පහත දැක්වේ.

| | එජඩො | රු. |
|---|---|---|
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 47,744 | 5,438,128 |
| එකතුකළා :- විදේශ විනිමය වාසිය | - | 705,403 |
| | 47,744 | 6,143,531 |
| අඩුකළා :- ආපසු ගැනීම් | 47,744 | 6,143,531 |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | නැත | නැත |

**3. විගණන නිරීක්ෂණ**

---------------------

**3.1 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර එළඹි ණය ගිවිසුම අනුව 2007 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දක්වා ණය සපයන නියෝජිතායතනය විසින් අයකරන ලද රු.158,585,186 ක් වූ පොලිය, පොලී වියදම් හා ආසියානු සංවර්ධන බැංකු ණය ලෙස ගිණුම් ගත කළ යුතු වුවද, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2007 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දක්වා ගෙවන ලද රු.399,036,598 ක් වූ පොලිය ශ්‍රී ලංකා රජය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර එළඹි අතිරේක ණය ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතියේ පොලී වියදම් හා ගෙවිය යුතු පොලී ලෙස ගිණුම්ගත කර තිබුණි. එබැවින් 2012 දෙසැම්බර් 31 දිනට පොලී වියදම් රු.240,451,412 කින් වැඩියෙන් දක්වා තිබුණු අතර ආසියානු සංවර්ධන බැංකු ණය රු.158,585,186 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) එකතුව රු.120,534,606 ක් වූ කොන්ත්‍රාත්කරුවකුට ගෙවිය යුතු මුදල් මහා භාණ්ඩාගාරයෙන් කිසිදු සීමා කිරීමක් හෝ එකඟත්වයක් ලබාගැනීමෙන් තොරව මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු අරමුදල් හා ශ්‍රී ලංකා රජයෙන් දායකය ලෙස ගිණුම්ගත කර තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් 04 කින් රු.8,038,196,706 ක් වටිනා කොන්ත්‍රාත් දෙකක් නිම කිරීමට සැලසුම් කරන ලද දින සමඟ සැසඳීමේදී මාස 19 සිට මාස 23 දක්වා ප්‍රමාදවී තිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරු විසින් වටිනාකම එකතුව රු.8,038,196,706 ක් වූ කොන්ත්‍රාත් දෙකක් 2011 ඔක්තෝබර් 20 හා 2012 අප්‍රේල් 30 දිනැති ස්ථාවර නිම කිරීම් සහතික දෙකක් මත

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට භාරදී තිබුණද, අවසාන නිම කිරීම් වාර්තාව 2013 ඔක්තෝබර් 31 වන විටත් නිකුත් කර නොතිබුණි.

**4. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**4.1 අරමුදල් උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සැලසුම් කරන ලද කාලය තුළ වෙන්කරන ලද සම්පත් යොදා ගනිමින් ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම තහවුරු කර ගනු වස් සමස්ත ව්‍යාපෘති කාලය ආවරණය වන පරිදි මාසිකව, කාර්තුමය හා අර්ධ වාර්ෂික ආකාරයෙන් වගකීම් සහිතව මූල්‍ය හා භෞතික ඉලක්කයන් දක්වමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද ව්‍යාපෘතිය විසින් එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ලබාගත හැකිවූ තොරතුරු අනුව, 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ.

| | ආසබැ | ශ්‍රීලංර | එකතුව |
|---|---|---|---|
| එකඟවූ දායකය (එජඩො මිලියනවලින් ) | 46.5 | 24.0 | 70.5 |
| එකතු කළා :- විනිමය වෙනස | 2.3 | - | 2.3 |
| අතිරේක ප්‍රතිපාදනය | - | 17.9 | 17.9 |
| | ------- | ------ | ------- |
| මුළු ප්‍රතිපාදනය | 48.8 | 41.9 | 90.7 |
| 2012 දෙසැම්බර් 31 දක්වා තථ්‍ය වියදම (එජඩො මිලියනවලින් ) | 48.8 | 35.7 | 84.5 |
| අරමුදල් උපයෝජනය ප්‍රතිශතයක් ලෙස | 100 | 85.2 | 93.2 |

(ඇ) මූල්‍යායනය හා සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය හා 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| | සැපයීම සඳහා එකඟවූ මුදල | | 2012 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | 2012 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් (මුදල් පදනම ) |
|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ආසබැ | 48.80 | 5,500.80 | 359.39 | 345.61 | 5,488.79 |
| ශ්‍රී ලංකා රජය | 41.87 | 4,720.10 | 158.75 | 140.93 | 3,891.03 |
| එකතුව | 90.67 | 10,220.90 | 518.14 | 486.54 ★★ | 9,379.82 ★★ |

★★ උපචිත වියදම්වල බලපෑම හේතුවෙන් මෙම වාර්තාවේ 2.1 ජේදයේ දැක්වෙන සංඛ්‍යාවලින් ඉහත සඳහන් සංඛ්‍යා වෙනස් වේ.

## 4.2 භෞතික ප්‍රගතිය

විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව, ආරම්භයේදී එජඩො මිලියන 70.5 ක පිරිවැයකට උප ව්‍යාපෘති 5 ක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද, පසුව එක් උප ව්‍යාපෘතියක් ඉවත් කර තිබුණු අතර ඉතිරි ව්‍යාපෘති 04 පිළිබඳ පිරිවැය සංශෝධනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස උප ව්‍යාපෘතිවල මුළු පිරිවැය ප්‍රධාන වශයෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාදවීම හේතුවෙන් සියයට 43.3 කින් ඉහළ ගොස් තිබුණි. ප්‍රගතිය හා පිරිවැය විස්තර පහත පරිදි වේ.

| | උප ව්‍යාපෘති අංකය | පිරිවැය එජඩො මිලියන වලින් 2006 ආරම්භක | සංශෝධිත | 2012 දෙසැම්බර් 31 දිනට තථ්‍ය පිරිවැය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| | | | | එජඩො මිලියන | % |
| (i). | HW & T/UWS/PA1/BAT/ICB | 35.81 | 51.93 | 50.30 | 100 |
| (ii). | PW & ET/ UWS/PC1/BAT/ICB | 13.75 | 22.13 | 20.90 | 100 |
| (iii). | PW & ET/ UWS/PC2/HAM/ICB | 7.94 | 11.0 | 10.46 | 100 |
| (iv). | DR/UWS/PG2/MUT/NCB | 0.62 | 0.71 | 0.69 | 100 |
| (v). | පොලි හා වෙනත් ගාස්තු | 5.12 | 4.89 | 2.24 | |
| | එකතුව | 63.24 | 90.66 | 84.59 | |